සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2024 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරිසභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,399 - 2024 අගෝස්තු මස 23 වැනි සිකුරාදා - 2024.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 754 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 756 |

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 සැප්තැම්බර් 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අගෝස්තු 30 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

753 - B 82602 — 5,403 (2024/08)

# පළාත් පාලන නිවේදන

## හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ විරෝධතා කැඳවීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වලට අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මාස තුනක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) වගන්තිය යටතේ උපලේඛනයේ සඳහන් මංමාවත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් ස්ථිර වශයෙන්ම පාලනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. ආර්. අතාවුද,
ලේකම්,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

1. මාර්ගයේ නම - කොණ්ඩදෙනිය එගොඩවත්ත නිවාස පාර
2. ග්‍රාම නිලධාරි වසම - 423, කොණ්ඩදෙණිය

ආරම්භය - බෝයගොඩ මරණාධාර සමිති ශාලාව අසළින්
ආවසානය - එම්. ජී හෙන්ද්‍රික් ආරියසිංහ මහතාගේ නිවසට පහළ ඇල්ල අසළින්

*වම්පස* -

ඇම්. ජී. විජිතා නවරත්න මිය, අංක 280, කොණ්ඩදෙනිය, කටුගස්තොට
ඇම්. ජී. ආර්. කේ. ආරියසිංහ මයා, අංක 283/4, කොණ්ඩදෙනිය, කටුගස්තොට

*දකුණුපස* -


ඇම්. ජී විජිතා නවරත්න මිය, අංක 280, කොණ්ඩදෙනිය, කටුගස්තොට
ඇම්. ජී. ආර්. කේ. ආරියසිංහ මයා, අංක 283/4, කොණ්ඩදෙනිය, කටුගස්තොට

මාර්ගයේ පළල - අඩි 08
මාර්ගයේ දිග - අඩි 132

පිඹුරුපත - මිනින්දෝරු ආර්. වීරසිංහ විසින් මැන අඳින ලද අංක 20465 දරන පිඹුරුපත

Ranjith Weerasinghe F.S.I.
Licensed Surveyor & Leveller
14/55, Kurunegala Road
Nugawela
Tel: 081-2491475; 071-0695252
email: weerasinghe_ranjith@yahoo.com

# PLAN No. 20465A




Reference

| | |
|---|---|
| B | Bank |
| L | Land Mark |
| LF | Live Fence |
| Road(P.S.) | Road(Pradeshiya Sabha) |
| St | Stake |

SCALE 1 : 500

## PLAN

Of

An allotment of land marked lot 1 called

Part of EGODAWATTA

(Part of Lot 62 in CM 320300-06 Authenticated by Surveyor General)

(Proposed Concrete Road to Houses 6ft. Wide)

being Resurvey of Lot 1A in my Plan No. 20465 dated 29-01-2024

(Subdivided on 07-07-2024 by me)

Situated at


KONDADENIYA

in Kulugammana Siyapattu of Harispaththu

KANDY DISTRICT

CENTRAL PROVINCE

| Lot No: | Extent | | | | Length | |
|---|---|---|---|---|---|---|
| | Hectare | A. | R. | P. | M. | Ft. |
| 1 | 0.0056 | 0 | 0 | 02.21 | 33 | 108 |



Surveyed on 07-07-2024

**මාතර මහා නගර සභාව**

2024 මාතර අප ස්වාමි දුවගේ සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය සඳහා මාර්ග වසා තැබීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරය යටතේ මහ නගර සභා ආඥාපනත මගින් මා වෙත පැවරී ඇති බලතල අනුව, 2017 මාර්තු 03 දිනැති අංක 2009 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකර ප්‍රසිද්ධියට පත් කර, මාතර මහා නගර සභාව විසින් වැළඳගන්නා ලද, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් කෙටුම්පත් කර ප්‍රසිද්ධියට පත් කරන ලද අංක 1811 හා 2013 මැයි 17 වන දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ "වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ" 2 වන වගන්තිය ප්‍රකාරව, මාතර අප ස්වාමි දුවගේ සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය පැවැත්වෙන **2024 සැප්තැම්බර් 06 දින මධ්‍යාහ්න 12.00 සිට 2024 සැප්තැම්බර් 08 දින පස්වරු 2.00 දක්වා** රණවිරු ස්මාරකය අසල සිට මාතර වෙරළ පාරෙහි අරලිය මාවත දක්වා කොටස, මාතර මහජන පොල අසල මාර්කට් පාර, මහාමායා මාවත, සර්වේශස් මාවත සහ අරලිය මාවත රථවාහන ධාවනය සඳහා වසා තබනු ලබන බව මෙයින් නිවේදනය කර ප්‍රසිද්ධ කරමි.

නෙළුම් ඒ. ගමගේ,
නාගරික කොමසාරිස්,
මාතර මහා නගර සභාව.

2024 අගෝස්තු මස 09 වැනි දින,
මාතර මහා නගර සභා කාර්යාලයේ දී ය.

08-170

---

# විවිධ දැන්වීම්

**කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව**

2024 වර්ෂය සඳහා සේවා සැපයීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වන පී. ආර්. ඉනෝකා ප්‍රියදර්ශනී යන අය විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය ප්‍රකාරව කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටුකරනු ලබන පොදු උපයෝගීතා සේවා, සුභසාධක සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීමේ දී අවශ්‍ය කරන සේවා සැපයීමේ දී 2024 වර්ෂය ඇතුළත ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු සඳහන් උපලේඛනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2357 හා 2023.11.03 දින දරන *ගැසට් පත්‍රයේ* 1598 පිටුවේ අංක 06 යටතේ ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම සඳහා අය කරනු ලබන ගාස්තු පහත පරිදි සංශෝධනය විය යුතු බව කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභා පරිපාලන කමිටුව විසින් 2024.08.02 දින තීරණ අංක KGD/2024/07/22/71 යටතේ තීරණය කරන ලදී.

ඩී. එම්. ඩබ්. කුමාරිහාමි,
බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව.

2024 අගොස්තු 07 වැනි දින,
කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩී. එම්. ඩබ්. කුමාරිහාමි වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය ප්‍රකාරව කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටුකරනු ලබන පොදු උපයෝගීතා සේවා, සුභ සාධක සේවා සහ වෙනත් බලතල ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය කරන සේවා සැපයීමේ දී 2024 වර්ෂයේ ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රාදේශීය සභා අරමුදලට අයකර ගත යුතු ගාස්තු මෙහි උපලේඛනයේ සඳහන් ආකාරයට සංශෝධනය විය යුතු යයි මම තීරණය කරමි.

*සංශෝධනය*

- නේවාසික ස්ථාන සඳහා පෙරසැරි ගාස්තු වර්ග අඩි 01 ක් සඳහා රු. 2.00
- වාණිජ ස්ථාන සඳහා පෙරසැරි ගාස්තු වර්ග අඩි 01 ක් සඳහා රු. 3.00
- ආගමික හා රාජ්‍ය ආයතන සඳහා පෙරසැරි ගාස්තු වර්ග අඩි 01 ක් සඳහා රු. 1.00

- නේවාසික ස්ථාන සඳහා පරීක්ෂණ ගාස්තු වර්ග අඩි 01 ක් සඳහා රු. 3.00
- වාණිජ ස්ථාන සඳහා පරීක්ෂණ ගාස්තු වර්ග අඩි 01 ක් සඳහා රු. 5.00
- ආගමික හා රාජ්‍ය ආයතන සඳහා පරීක්ෂණ ගාස්තු වර්ග අඩි 01 ක් සඳහා රු. 1.00

- ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම සඳහා සංවර්ධන බලපත්‍ර ගාස්තු :
  - නේවාසික සඳහා රු. 1,500.00
  - වාණිජ කටයුතු සඳහා රු. 2,000.00
  - ආගමික හා රාජ්‍ය ආයතන සඳහා රු. 1,000.00

08 - 182